සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணை மதிப்பீடு - 2019
First Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | Islam | පත්‍රය / வினாத்தாள் / Paper | I,II | පැය / மணித்தியாலம் / Hours | 3 |
|---|---|---|---|---|---|---|---|

## I වන කොටස

**● සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. ඉතිහාසයේ ජීවත් වූ සියලු ධර්ම දූතයින් විසින් දේශනා කරණු ලැබූ එකම කරුණ කුමක්ද?
1) ෂරීආ 2) තරීකා 3) අකීදා 4) මස්හබ්

02. ඉස්ලාමීය අකීදාහි පාරිශුද්ධත්වය රැක ගැනීමට ප්‍රයත්න දැරූ විද්වතුන් අතරින් කෙනකු වන්නේ,
1) ඉමාම් අබුල් හසන් ෂාදුලි 2) ඉමාම් අබුල් හසන් අෂ්හරි
3) ඉමාම් මන්සූර් අල්හල්ලාජ් 4) ඉමාම් අබූදවුද් අෂ්හරි

03. ඉස්මත් යන පදයේ අර්ථය කුමක්ද?
1) පාපයෙන් නබිවරු මුදවා ගැනීමයි
2) අව්ලියාවරුන්ට ලැබූ ප්‍රාතිහාර්යයි
3) නබිවරුන්ට ලැබූ ප්‍රාතිහාර්යයි
4) නබිවරුන් හා ඔවුන්ගේ බිරිඳවරුන් ව පාපයෙන් මුදවා ගැනීමයි

04. ඉස්ලාමීය දැක්මට අනුව එක දේවත්වය හඳුන්වන පදය කුමක්ද?
1) හකීකත් 2) රිසාලත් 3) හිදායත් 4) තව්හීද්

05. අල්ලාහ් ඔහුට අභිමත වූ අයගේ සියලු පාපයන්ට සමාව දෙන්නේය. එකක් හැර එය කුමක්ද?
1) සලාතය අත්හැරීම 2) අල්ලාහ්ට සම කිරීම
3) දෙමාපියන්ට හිංසා කිරීම 4) රෝග සුභ කිරීමට පාරායනා කිරීම

06. අල්ලාහ් ගේ දේව ගුණ කිසිවෙකුට හෝ කිසියම් ශක්තියට හිමිකමක් ඇති බව විශ්වාස කිරීම ඉස්ලාමීය දැක්මට අනුව කෙසේ අමතනු ලබන්නේද?
1) ෂිර්ක් 2) කුෆ්ර් 3) රිද්දත් 4) ඉල්හාද්

07. පහත සඳහන් කරුණුවලින් මහා ෂිර්කයම් අදාළ වන ක්‍රියාව කුමක්ද?
1) කුර්බාන් දීම 2) සුර බැඳීම
3) නිමිති, සාස්තර බැලීම 4) දේව මැවුම්වලින් ප්‍රාර්ථනා කිරීම

08. මුහම්මද් (සල්) තුමාට පසු කිසිදු නබිවරයෙකු නො එන බවට හේතුවන සාධාරණ කරුණකි,
1) සෑම තැනකම මුස්ලිම්වරු දැකිය හැක
2) ඉස්ලාම් ආගම සම්පූර්ණ වීම
3) දහ්වා දේශනා පැවතීම
4) ඉස්ලාමීය ආයතන දක්නට ලැබීම

09. ඉස්ලාමීය විශ්වාසයේ කලා කද්රය හා සම්බන්ධ වූ අල්ලාහ්ගේ සිෆතයන් කුමක්ද?
1) අල්ඉල්ම් , අල්කුද්රත් , අල්ඉරාදත්
2) අල්ඉල්ම් , අල්බකාඋ , අස්සමද්
3) අල්හයාත් , අල්වජූද් , අල්බස්ර්
4) අල්කිදම් , අල්වුජූද් , අල්මුරිද්

10. කලා කද්රය පිළිබඳ විශ්වාසය ඉස්ලාමීය අකීදාවේ කුමන කොටසේ අඩංගුවේද?
    1) අර්රුභානියාත්    2) අස්සම්ඉයියාත්    3) අල්ඉලාහියියාත්    4) අන්නුබුව්වාත්

11. ඉස්ලාමීය වගකීම් පහ අතරින් තුන්වන ස්ථානය දරන වගකීමය කුමක්ද?
    1) සලාතය    2) උපවාසය    3) සකාත්    4) හජ්

12. වසරක් පුරා කෙනෙකු සතුව ගවයින් 140ක් සිටියිනම් ඔහු ලබා දිය යුතු සකාත් හි ප්‍රමාණය,
    1) ගව නාම්බන් දෙදෙනෙක් හා එළදෙනුන් දෙදෙනෙක්
    2) ගව නාම්බන් හතරක්
    3) එළ දෙනෙනුන් හතරක් හා ගව නාම්බන් දෙදෙනෙක්
    4) එළ දෙනෙනුන් හතරක්

13. නුඹලාට පෙර සිටි අය කෙරෙහි පවරනු ලැබුවාක් මෙන් නුඹලා කෙරෙහි ද පවරා ඇති බව කුර්ආනයේ සඳහන් වන වගකිම කුමක්ද?
    1) සලාතය    2) උපවාසය    3) සකාත්    4) හජ්

14. හජ් හි මුහර්රමාත්යකි,
    1) කාන්තාවන් මුහුණ වැසීම
    2) හරම් ප්‍රදේශය තුළ ඇවිදීම
    3) සම් සම් ජලය වැඩි වශයෙන් පාරායනා කිරීම
    4) මක්කාවට ඇතුළු වූ විගස තවාෆ් කිරීම

15. පරලොවේදී, සවුම්දාරින් ස්වර්ගයට පිවිසෙන දොරටුව කුමක්ද?
    1) බාබුල් ඉස්ලාම්    2) බාබුල් සලාම්
    3) බාබුල් ෆිර්දව්ස්    4) බාබුල් රයියාන්

16. වසරක් පුරා පුද්ගලයෙකු සතුව රු. ලක්‍ෂ. 25ක් තිබුණි. එම වර්ෂයේ ඔහු ගෙවිය යුතු ණය ප්‍රමාණය රු. ලක්‍ෂ. 15කි. ඔහුට ලැබිය යුතු ණය ප්‍රමාණය රු. ලක්‍ෂ. 5ක් නම් ඔහු කවර ප්‍රමාණයක සකාත් ගැවිය යුතුද?
    1) රු. ලක්‍ෂ. 45ක්    2) රු. ලක්‍ෂ. 15ක්    3) රු. ලක්‍ෂ. 5ක්    4) රු. ලක්‍ෂ. 20ක්

17. "මා කුස පුරා අනුබව කළ විට දුගීන්ගේ කුස අමතක වී යාවිදෝ යැයි බිය වෙමී" යනුවෙන් පැවසූ නබිවරයා කවුද?
    1) මුහම්මද් (සල්)    2) මූසා (අලෛ)    3) යූසුෆ් (අලෛ)    4) ඉබ්රාහීම් (අලෛ)

18. අයියාමුත් තෂ්රික් යන දිනවල උපවාසය රැකීම පිළිබඳ නීතීය කුමක්ද?
    1) සුන්නත්    2) ෆර්ල්    3) මක්රූහ්    4) හරාම්

19. මෙහිදි ඉටු කරනු ලබන සලාතයක්, අනෙකුත් ස්ථානවල ඉටු කරනු ලබන සලාත් ලක්‍ෂයක් ඉටු කළා හා සමාන වේ. එය,
    1) මස්ජිදුල් අක්සා    2) මස්ජිදුන් නබවි    3) මස්ජිදුල් හරම්    4) මස්ජිදුල් කුබා

20. නබි (සල්) තුමාණන් මස්ජිදුල් හරම් සිට මස්ජිදුල් අක්සාව දක්වා ගිය ගමන කෙසේ හඳුන්වනු ලබන්නේද?
    1) හිජ්රත්    2) ඉස්රා    3) මිහ්රාජ්    4) සිත්රතුල් මුන්තහා

21. අනුමත කළ ගමනක යෙදි එය සම්පූර්ණ කිරීමට නොහෙකි වන අය සකාත් සැබීමට හිමිකම් ලබන්නේ කවර කාණ්ඩයටද?
    1) ආමිල්    2) ඉබ්නු සබීල්    3) කාරිමූන්    4) මිස්කීන්

22. එක වගකීමක් ඉටු නොකළ විට අල්ලාහ් දුගීභව හා වැසි වළක්වා පරීක්ෂාවට ලක් කරන බව හදීසයේ සඳහන් කරුණ කුමක්ද?
1) සලාතය 2) හජ් 3) උපවාසය 4) සකාත්

23. සකාතයේ ෆර්ල් දෙකකි. නියියත් තැබීම එකයි. අනෙක් කරුණ කුමක්ද?
1) බයිතුල්මාල්යට දීම 2) දුගීන්ට දීම
3) සුදුස්සන්ට ලබා දීම 4) ගණනය කිරීම

24. අල්ලාහ් දේව භක්තිකයන්ට විශේෂයෙන් පිරිනමන ලද කරුණ කුමක්ද?
1) කරාමත් 2) මුඃජිසාත් 3) කුද්රත් 4) විලායත්

25. 25 - 26 යන ප්‍රශ්ණවල **අ** - **ආ** කොටස් එකිනෙකට සම්බන්ධතාවයක් දක්වයි. ඒ අනුව අනුපිළිවලින් ගළපා ඇති වරණය තෝරන්න.

| **අ** | **ආ** |
|---|---|
| 1) කුෆ්ර් | A. අදේව වාදය |
| 2) ෂිර්ක් | B. එක් රැස් කිරීම |
| 3) ඉල්හාද් | C. වාංචනික |
| 4) නිෆාක් | D. ප්‍රතික්ෂේප |

1. BCDA 2. BADC 3. DBCA 4. DBAC

26.

| | |
|---|---|
| 1) මුඅල්ලෆතුල් කුලූබ් | A. අන්ත දුගියා |
| 2) ෆකීර් | B. අවශ්‍ය පමණ ආදයම් නොලබන්නා |
| 3) මිස්කීන් | C. ඉස්ලාමය වෙන සිත බැඳුණු පිරිස |
| 4) ආමිල් | D. සකාත් ගණනය කරන අය |

1. ACBD 2. BCAD 3. CABD 4. DCBA

27. පහත සඳහන් කරුණ අතරින් ෆර්ල් අයින් වූ ඉබාදතය කුමක්ද?
1) උත්සව දින සලාතය 2) තරාවීහ් සලාතය
3) ජනාසා සලාතය 4) පස්වෙල සලාතය

28. මුස්ලිම්වරයකුගේ ජීවිතයේ ඉටු කළ යුතු වගකීම් තුන අන්තර්ගත කොටස කුමක්ද?
1) ඉබාදත් , කිලාෆත් , ඉමාමත්
2) ඉබාදත් , කිලාෆත් , ඉමාරත්
3) ඉබාදත් , කිලාෆත් , විලායත්
4) ඉබාදත් , මුල්තියත් , ඉමාරත්

29. අල්ලාහ් පමණක් එකම දෙවියා ලෙස පිළිගෙන ඔහුට යටත් වන බව සඳහන් වචනය කුමක්ද?
1) තව්හිද් 2) තරීකත් 3) තබ්ලීහ් 4) අකීදා

30. "ලාඉලාහ ඉල්ලල්ලාහ්" යනුවෙන් හැදින්වෙන වචනය කුමක්ද?
1) තහ්මීද් 2) තහ්ලීල් 3) තව්හිද් 4) තම්ජීද්

31. පරලොවේදි ගැත්තා වෙනුවෙන් අල්ලාහ් සමග කන්නලව් කරන අංගයන් දෙක කුමක්ද?
1) සලාතය හා දික්ර් 2) උපවාසය හා හජ්
3) උපවාසය හා අල් කුර්ආනය 4) සලාතය හා උපවාසය

32. නබි (සල්) තුමාණන්ට පසුව කිලාෆතය සඳහා සුදුස්සා කවුරුදැයි තීර්ණය කිරීම මත ඇති වූ දේශපාලනික ගැටුම් මත බිහි වූ චින්තනවාදි පිරිස වන්නේ,
1) ජබරියා 2) මුර්ජියියා 3)මුඃතසිලා 4) ෂීආ

33. අල්ලාහ් මිනිසා හා ජින්වරුන් මැවීමේ ප්‍රධාන අරමුණ කුමක්ද?
1) ෂරීආව රැක ගැනීමට 2) ඉමාරත් වගකීම ඉටු කිරීමට
3) ඉබාදත් කිරීමට 4) කිලාෆත් පිහිටුවීමට

34. නබි (සල්) තුමාණන් හා එතුමාගේ සහාබාවරුන් ජීවත් වූ ක්‍රමය අනුගමනය කරන අය කවුරුන්ද?
1) අහ්ලුස් සුන්නා වල් ජමාආ 2) අහ්මදියාවරු
3) ෂීආවරු 4) ජබරියියාවරු

35. නබි ඉබ්‍රාහීම් තුමාටද, මූසා නබි තුමාටද, ඊසා නබි තුමාටද, අප දේශනා කළ දේ යනු වෙන් අල්කුර්ආනයේ සඳහන් වන්නේ කුමක්ද?

1) අල්ලාහ්ට සමානයන් නොතබන්න, දෙමාපියන්ට කීකරු වන්න
2) සලාතය ඉටු කරන්න, සකාතය ලබා දෙන්න
3) දෙමාපියන්ට කීකරුවන්න, දාන ශීලි වන්න
4) ධම්යෙහි රැඳෙන්න, එහි භේද නොමන්න

36. අල්ලාහ් පරලොවේදි තම ගැත්තාගෙන් ප්‍රථමයෙන් විමසන්නේ කුමක්ද?
1) සලාතය 2) කලිමා 3) ඊමාන් 4) උපවාසය

37. අල් කුර්ආනයේ සූරතුල් අඃලාවේ සඳහන් සුහුෆ් ලැබූ නබිවරු දෙදෙනා කවුරුන්ද?
1) ආදම් (අලෛ) , ෂීද් (අලෛ) 2) ඉබ්‍රාහීම් (අලෛ) , මූසා (අලෛ)
3) ඊසා (අලෛ) , මුහම්මද් (සල්) 4) ඉබ්‍රාහීම් (අලෛ) , ඉද්රීස් (අලෛ)

38. ශරීරය හා ක්‍රියාව සමග සම්බන්ධ වූ ඉබාදතයකි,
1) සලාතය 2) ඉඃලාස් 3) සකාත් 4) දික්ර්

39. රන් රිදී හා නිදන් වස්තු හිමි වි, නිසි නිසාබ් තත්වයට පත්වූයේ නම් සකාත් වශයෙන් දිය යුතු ප්‍රමාණය කොපමණද?
1) 2.5% 2) 5% 3) 20% 4) 40%

40. හජ් හි වාජිබ්යේ අඩංගු ක්‍රයාව කුමක්ද?
1) සඊ කිරීම 2) මිනාවේ රැඳීම
3) අරෆාහි රැඳීම 4) මීකාතයේ නීයියත් තැබීම

(ලකුණු 40)

## II වන කොටස

❖ පළමුවන ප්‍රශ්ණය ඇතුළුව ප්‍රශ්ණ පහකට පමනක් පිළිතුරු සපයන්න.

**01. කෙටි පිළිතුරු සපයන්න.**

1) හියාදත්, රිසාලත් යන පදවල අර්ථය කුමක්ද?
2) ඊමානයේ කරුණු අවබෝධ කර ගැනීමට පදනම් වන මූලාධාරයන් මොනවාද?
3) මුස්ලිම්වරයෙකු ශුද්ධ වූ වන්දනා යාමට හැකි සිද්ධස්ථාන දෙකක් ලියා දක්වන්න.
4) ඊමානයේ වර්ග මොනවාද?
5) කුෆ්රය ඇති කරන ක්‍රම දෙකක් සඳහන් කරන්න.
6) ෆර්ලු කිෆායා යනු කුමක්ද? එයට උදහරණ දක්වන්න.
7) අල්මාඋන් තහූර් යනු කුමක්ද? එයට උදහරණ දක්වන්න.
8) තර්තීබුන් නුසූල් යනු කුමක්ද?
9) කලා , කද්ර් යන පද දෙකේ අර්ථයන් ලියා දක්වන්න.
10) වහි හි වර්ග සඳහන් කරන්න.

**02. ඉස්ලාමීය විශ්වාසය ආශ්‍රිතව පහත සඳහන් කරුණු පහදන්න.**
1) රිද්දත් , නිෆාක් අතර වෙනස කුමක්ද?
2) විශ්වාස සම්බන්ධව අකීදා ක්ෂේත්‍ර පිළිබඳ විද්වතුන් බෙදා වෙන් කර ඇති කොටස් තුනක් සඳහන් කරන්න.
3) මුර්තද් වශයෙන් වෙනස් වූ තැනැත්තා පිළිබඳව ඉස්ලාමයේ තත්වය කුමක්ද?

**03. ඉබාදත් සම්බන්ධ පහත සඳහන් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.**
1) සවුම් යන පදයේ අර්ථය කුමක්ද?
2) සකාත් මගින් ලැබෙන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.
3) හජ් හි අදාල ස්ථානයන් නම් කර එහිදි සිදු කරන ක්‍රියාවන් සඳහන් කරන්න.

**04.**
1) තව්හිදයට බලපාන කරුණු මොනවාද?
2) අකිදාව ආශ්‍රිතව නොමග ගිය දාර්ශනික කොටස් හතරක් සඳහන් කරන්න.
3) ෂිර්ක් වර්ග කර එයට උදහරණ දක්වන්න.

**05. කාත්මුන් නුබුව්වාත් ආශ්‍රිතව පහත සඳහන් ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.**
1) කාත්මුන් නුබුව්වාත් යන පදය තුළින් කුමක් අවබෝධ කර ගත්තෙහිද?
2) කාත්මුන් නුබුව්වාත් ප්‍රතිපත්තියට විරුද්ධව ප්‍රශ්ණය දියත් කළ තිදෙනෙකුගේ නම් ලියන්න.
3) කාත්මුන් නුබුව්වත් ප්‍රතිපත්තිවලට තාර්කික සාක්ෂි තුනක් ලියා දක්වන්න.

**06.**
1) හජ් හි විශේෂත්වයන් දෙකක් ලියන්න
2) හජ් හි ෆර්ලු ලියන්න.
3) හජ් හි ප්‍රයෝජන පහදන්න.

**07. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සමහන් ලියන්න.**
1) මස්ජිදුල් අක්සා
2) මස්ජිදුන් නබවි
3) අන්නිෆාක්
4) උපවාසය මගින් ලැබෙන ප්‍රයෝජන